**ශීර්ෂය 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය සහ ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වෙත 2018 සැප්තැම්බර් 11 දින නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4** **විගණන නිරීක්ෂණය**

**-----------------------**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.10 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරිගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| ---------------------------------------------- | | ---------------------------- | ---------------- |
| මුදල් රෙගුලාසි<br>------------ | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි.<br>2. කාර්යභාරයන් ඉටු නොකිරීම.<br>3. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරිම සහ ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු<br>4. අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් නොවීම | 2.1.1<br>2.1.2<br>2.2<br>2.9 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්වය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද | මානව සම්පත් කලමනාකරනයේ අඩුපාඩු | 2.10 |

| | | | |
|---|---|---|---|
| | සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනිමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයිම් අධීක්ෂණය හා පරීක්ෂා කිරිමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබිම. | | |
| 128(1)(ඉ) | රජය සතු වු හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබු පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාරතා කරන බව, | 1. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම<br>2. ගනුදෙනු බේරා වසාදැමීමේ කටයුතු කරගෙන යාම සහා අත්තිකාරම් ගිණුමේ ඇවර කිරිමේ කටයුතු අවසන් නොකිරීම | 2.6<br>2.7 |

| | | | |
|---|---|---|---|
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, ඵලදායිත්වය හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | කළමණාකරන දුර්වලතා | 2.4 |

**2.** **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**2.1** **කාර්යසාධනය**

**2.1.1** **සැලැසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් ඉටු කෙරෙන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් 05 කින් එක් කාර්යයක් වන "කෘමි උවදුරුවලින් තොර ධාන්‍යමය ගබඩා පරිසරයන් ඇති කිරීම යන කාර්යය පමණක් හා ක්‍රියාකාරී සැලසුමෙහි ඇතුලත් කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතු ප්‍රධාන කාර්යභාරය වන ගබඩාවල මෙට්‍රික් ටොන් 100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වා ගත යුතු වුවද, ඒ සම්බන්ධයෙන් වූ සැලසුම් කිසිවක් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

(ඇ) 2017 අප්‍රේල් 05 දින පවත්වන ලද ගිණුම්කාරක සභා රැස්වීමේදී දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් යටතේ දෙපාර්තමේන්තු මෙහෙවර යථාර්ථයක් බවට පත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලෙස දන්වා තිබුණද 2018 සැප්තැම්බර් 11 දින වන විටත් ව්‍යාපෘති වාර්තාවක් සහ අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.1.2** **කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් බාහිර ආයතන වෙත ධූමායන සේවා සැපයීමෙන් රු.2,205,772 ක ආදායමක් උපයා තිබු අතර, සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ධූමායන සේවා සැපයීමෙන් රු.මිලියන 1 ක ආදායමක් ඉපයීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු තථ්‍ය ආදායම රු.72,119 ක් වූ අතර එය සැලසුම්ගත ආදායමින් සියයට 7.2 ක් ද, ඉකුත් වර්ෂයේ ආදායම සමඟ සැසඳීමේදී සියයට 3.27 ක්ද වී තිබුණි.

(ආ) ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් 05 ක් ඉටු කර ගැනීමේ අරමුණින් සහල් ආරක්ෂිත තොග වශයෙන් පවත්වාගෙන යාම හා අපනයනය සඳහා යොමු වීමේ අපේක්ෂාවෙන් අවශ්‍ය ප්‍රමිතින්ට යටත්ව දේශිය සහල් මිලයට ගැනීම ක්‍රියාවට නැංවීමට වේයන්ගොඩ ගබඩා පරිශ්‍රයේ ගබඩා 06 ක් නවීකරණය වෙනුවෙන් 2012 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ රු.මිලියන 252.06 ක් වැයකර කර තිබුණි. එසේ වුවද, 2013 වර්ෂයේ නියමු ව්‍යාපෘතියේ සාර්ථකත්වය ඇගයීම සඳහා මෙට්‍රික් ටොන් 5400 ක ධාරිතාවයකින් යුතු වේයන්ගොඩ අංක 10 ගබඩාවේ ගබඩා කරන ලද මෙට්‍රික්ටොන් 668 ක සහල් තොගය අවසන් වීමෙන් පසුව 2014 ජනවාරි 01 සිට 2018 ජුලි 31 දින දක්වාම ආහාර දෙපාර්තමේන්තුව සතුව කිසිදු ආරක්ෂිත සහල් තොගයක් ගබඩාවල නොතිබුණි. එසේ වුවද, 2018 පෙබරවාරි 28 දිනැති හා අමප/18/0244//723/004 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ගබඩා 05 ක් නවීකරණය සඳහා 2018, 2019 හා 2020 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 175 ක්, රු.මිලියන 150 ක්, රු.මිලියන 60 ක් වශයෙන් එකතුව රු. මිලියන 385 ක ප්‍රතිපාදන අනුමත වී තිබුණි.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

---------------------------------------------------------------

### ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම

---------------------------------

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 205.50 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 181.28 ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සම්බන්ධයෙන් පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැසුම් පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුව 2017 වර්ෂය සඳහා වාර්ෂික යෝජිත ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණද, එය සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ අපේක්ෂිත කාර්යයන් ඉටු කෙරෙන ආකාරයට පිළියෙල කර නොතිබුණි.

(ආ) ගොඩනැගිලි ඉදිකිරීම් අලුත්වැඩියා සඳහා ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 200.50 ක් වූ අතර, වියදම රු.මිලියන 176.90 ක් වී තිබුණි. එසේ වුවද, වාර්ෂික යෝජිත ප්‍රසම්පාදන සැලැස්මේ ගොඩනැගිලි ඉදිකිරීම හා අලුත්වැඩියා සඳහා වෙන් කිරීම් සිදු කර නොතිබුණි.

(ඇ) එක් එක් කොන්ත්‍රාත් සඳහා ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර නොතිබීමත්, ප්‍රදානය කර ඇති කොන්ත්‍රාත් කාලීනව හා නිසි පරිදි ඉටුවන බවට හා කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් නිසි අයුරින් සිදු කරන බව පසු විපරම් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත් පරිපාලන සැලැස්මක් නඩත්තු කර නොතිබුණි.

(ඇ) (i) ඇස්තමේන්තු පිරිවැය රු.169,201,859 ක් වූ වේයන්ගොඩ ගබඩා සංකීර්ණයේ විද්‍යාත්මකව පාලනය කරන ලද පරිසර සාධක පදනම් කරගත් ක්‍රමවේදය උපයෝගි කරගෙන ගබඩා 05 ක් සංවර්ධනය කිරීමේ ප්‍රසම්පාදනයන් 03 ක් සඳහා මිල ගණන් කැඳවීමේදී ප්‍රසම්පාදන දැන්වීම සිංහල,ඉංග්‍රිසි හා දෙමළ පුවත්පත් 3 හිම ඉංග්‍රිසි භාෂාවෙන් පමණක් පළකර තිබුණි. මේ හේතුවෙන් ලංසුකරුවන්ට ඔවුන්ගේ ලංසු ඉදිරිපත් කිරීමට ඇති අවස්ථාව සීමා වී තිබූ අතර දෙපාර්තමේන්තුවටද වඩා වාසිදායක ලංසුකරුවන් තෝරා ගැනීම සීමා වී තිබුණි. මේ නිසා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ එක් අරමුණක් වන සුදුසකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට සහභාගි වීම සඳහා උපරිම අවස්ථා ලබා දීමේ අරමුණ ඉටු වී නොතිබුණි.

(ii)විද්‍යාත්මක ගබඩා ඉදිකිරීම සඳහා පත්කර ඇති මෙහෙයුම් කමිටුවේ 2016 ජුනි මස 15 දිනැති රැස්වීම් වාර්තාව අනුව ඉදිකිරිමට යෝජිත ගබඩාවල සාර්ථකත්වය රඳවා පවත්වා ගැනීම සඳහා එක් කොන්ත්‍රාත්කරුවකුට උපරිම වශයෙන් ටෙන්ඩර් 02 ක් පමණක් ලබා දීමට තීරණය කර තිබුණි. එසේ වුවද, ගබඩා 05 සිවිල් හා විදුලි කාර්මික වැඩ (Civil and Electrical works) සඳහා ටෙන්ඩර් 02 ක් ලෙස මිල ගණන් කැඳවා එක් සමාගමකට ගබඩා 05 හිම කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.

**2.3 වත්කම් කළමනාකරණය**

---------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වත්කම් ලේඛනගත කිරිම**

---------------------------

(i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි ඉඩම් ගොඩනැගිලි සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය 2017 දෙසැම්බර් 31 දින වන විටත් සකස් කර නොතිබුණු අතර 2018 වර්ෂයේදී ලේඛණය සකස් කිරීමේ කටයුතු ආරම්භ කර තිබුණද, එහි දෙපාර්තමේන්තුවට අයත් සියලුම ඉඩම් ගොඩනැගිලි සම්බන්ධ විස්තර ඇතුලත් කර නොතිබුණි.

(ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ පරිගණක ලේඛණය සකස් කර නොතිබුණි.

(iii) 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කලමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ දෙපාර්තමේන්තුවේ ඉඩම් ගොඩනැගිලි සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීමේදී, වත්කම්වල පිරිවැය සඳහන් කිරීමේදී 2013 වර්ෂයේ තක්සේරු වාර්තා පදනම් කරගෙන තිබුණි.

(iv) වේයන්ගොඩ ගබඩා සංකීර්ණයේ ඉඩම් ප්‍රමාණය හා එහි වටිනාකම සඳහන් කිරීමේදී රාජ්‍ය ආයතනවලට පවරා දී තිබුණු අක්කර 10 ක ඉඩම් ප්‍රමාණයද සමඟ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

(v) හෙක්ටයාර් 0.7145 ක් වූ දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇති ඉඩම හා ඒ තුල ඇතුළත් ගොඩනැගිලි වටිනාකම, බාන්ස් පෙදෙසෙහි පිහිටි අක්කර 1.5 ක් වූ ඉඩම් ගොඩනැගිලි සහ හෙක්ටයාර 8.42 ක් වූ ඔරුගොඩවත්ත භූමිය අදාල තොරතුරුවල ඇතුලත් කර නොතිබුණි.

**(ආ) වත්කම්වලින් රජයට ලැබිය යුතු ආදායම් නොලැබීම**

---------------------------------------------------

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව සතුව ගබඩා 121 ක් පවතින අතර මින් 40 ක් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත කුලියටද, ගබඩා 40 ක් රාජ්‍ය අංශයේ ආයතනවලට කුලී රහිතවද ගබඩා 20 ක්

ආහාර දෙපාර්තමේන්තුවේ පරිහරණය සඳහාද, ගබඩා 18 ක් ප්‍රාදේශිය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් වෙතද ලබා දී තිබූ අතර ගබඩා 03 ක් භාවිතයට නුසුදුසු ලෙස පැවතිනි. මීන් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත කුලියට ලබා දුන් ගබඩාවලින් 2017 දෙසැම්බර් 31 දිනට රු.54,330,341 ක් අයවිය යුතුව තිබුණි.

- ඔරුගොඩවත්ත අංක 01 ගබඩාව 2017 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දක්වා තක්සේරුගත මාසික කුලිය රු.500,000 කට පෞද්ගලික සමාගමක් වෙත බදු දී තිබුණද, සමාලෝචිත වර්ෂය තුලදී නියමිත පරිදි කුලී මුදල් අය වී නොතිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට රු.6,005,760 කුලී අයවිය යුතුව තිබුණි. එයින් 2018 සැප්තැම්බර් 11 දින වන විටත් අයවිය යුතු රු.4,979,543 ක් වූ හිඟ කුලී මුදල් අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- ඔරුගොඩවත්ත අංක 15 හා 16 ගබඩා 2009 වර්ෂයට පෙර බදු ගෙන තිබුණු පුද්ගලික සමාගමකින් 2017 දෙසැම්බර් 31 දිනට රු.1,734,095 ක් අයවීමට තිබුණද, 2018 සැප්තැම්බර් 11 දින වන විටත් එම බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ත්‍රිකුණාමලය, චීන වරාය පිහිටි ධාන්‍යාගම නිවාස සංකීර්ණයේ පැවති නිවාස 352 ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 1982 මාර්තු 12 දින ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව පවරා දී තිබුණද, එම නිවාස සංකීර්ණය පිහිටා තිබූ භූමියේ අයිතිය ආහාර කොමසාරිස් වෙත පැවරී නොතිබුණි. එම නිවාස ප්‍රීමා සමාගමේ සේවකයින්ට හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවකයින් වෙත කුලී පදනම මත ලබා දී තිබූ අතර එම නිවාස වලින් 2017 දෙසැම්බර් 31 දින වන විට රු.5,846,234 ක කුලියක් ලැබිය යුතුව තිබුණි.

(iii) ලංකා සතොස ආයතනය වෙත කුලියට ලබා දී තිබුණු දෙපාර්තමේන්තුව සතු ගබඩා 11 කින් 2017 දෙසැම්බර් 31 දිනට රු.21,138,123 ක් වූ හිඟ ගබඩා කුලී හා රු.908,035 ක්වූ බිම් රාක්ක සඳහා අයවිය යුතු මුදල් 2018 සැප්තැම්බර් 11 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

**(ඇ) රජයේ වත්කම්වල වටිනාකම හා ගුණාත්මකභාවය අඩුවීම**

**----------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2017 මාර්තු 15 දිනැති අමප/17/0383/710/007 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 07 බාන්ස් පෙදෙස, අංක 17 සහ 17 A හි පිහිටි අක්කර 1.5 ක භූමි ප්‍රමාණයකින් යුතු ඉඩම ශ්‍රී ලංකාවේ පකිස්ථානු මහකොමසාරිස් කාර්යාලය වෙත වෙන් කර දීම පිණිස අනුමැතිය ලබා දී තිබුණද, 2018 සැප්තැම්බර් 11 දින වන විටත් ඉඩම පවරා දී නොතිබුණි.

(ii) මෙම භූමියේ ගොඩනැගිලි 08 ක් පැවති අතර එම ගොඩනැගිලි කුලී රහිතව රාජ්‍ය ආයතන වසර ගණනාවක සිට පරිහරණය කරමින් පැවතුනි. මෙම ඉඩම පකිස්ථානු මහ කොමසාරිස් කාර්යාලය සඳහා වෙන් කර දීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු ඉඩමේ පැවති ගොඩනැගිලි හා එහි ඇතුලත් උපාංගවල වටිනාකම් පිළිබඳ රජයේ තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු නොකර ගොඩනැගිලි 2 ක් හැර ඉතිරි ගොඩනැගිලි කඩා දමා ඉවත් කර තිබුණි.

(iii) මෙම ඉඩමේ පැවති ගොඩනැගිලි පාවිච්චි කරමින් සිටි රාජ්‍ය ආයතන ඔවුන්ට අයත් කාර්යාල උපකරණ සමඟ ගොඩනැගිලිවල සියලු උපාංග ඉවත් කර තිබුණි. එසේ වුවද ගොඩනැගිලි උපාංග ඉවත් කිරීමෙන් වූ අලාභය අදාල ආයතනවලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

--------------------------------------

දෙපාර්තමේන්තුව විසින් රත්මලාන ගබඩා සංකීර්ණයේ අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

(i) දෙපාර්තමේන්තුවට අයත් අංක 01 රත්මලාන ගබඩා සංකීර්ණයේ ගබඩා විධිමත් අනුමැතියක් රහිතව, දේපල පිළිබඳ වාර්තාවක් සහ බදු ගිවිසුමකින් තොරව රත්මලාන ආර්ථික මධ්‍යස්ථානයට කුලී රහිතව ලබා දී තිබුණි.

(ii) ආර්ථික මධ්‍යස්ථානය පවත්වා ගෙන යන ගොඩනැගිල්ලට යාබදව දෙපාර්තමේන්තු ඉඩමෙහි පෞද්ගලික පාර්ශවයක් විසින් අනවසරයෙන් ගොඩනැගිල්ලක් ඉදි කර තිබුණි. මෙම දේපලෙහි අයිතිය ආහාර දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 කළමනාකරණ දුර්වලතා**

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දින වන විට මෙට්‍රික් ටොන් 22,500 ක් ගබඩා කළහැකි වන පරිදි වේයන්ගොඩ ගබඩා අංක 01,07,08,09,10 හා 16 ගබඩා නවීකරණය කර තිබුණද, සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් සහල් මෙට්‍රික් ටොන් 13,313 ක් පමණක් 2017 නොවැම්බර් මාසයේ සිට 2018 මාර්තු 15 දින වන විට ගබඩා කර තිබුණි. මෙය ගබඩා කළ හැකි තොගයෙන් සියයට 59 ක ප්‍රතිශතයක් පමණි. එසේ වුවද වේයන්ගොඩ ගබඩා පරිශ්‍රයේ විදුලිය ගාස්තු 2017 වර්ෂය සඳහා රු.869,537 ක්ද 2018 වර්ෂයේ ජනවාරි 01 සිට ජූනි 30 දක්වා රු.5,142,730 ක් ද ලෙස විදුලි ගාස්තු වියදම ඉතා ඉහල අගයක් ගෙන තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ගබඩා වෙත ලැබෙන සහල් තොග ගබඩාකරණයේදී අවශ්‍ය වන රසායනාගාර පරීක්ෂාවන් හා තත්ත්ව පරීක්ෂාවන් සිදු කිරීම සඳහා 2016 වර්ෂයේදී වේයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ එක් ගබඩාවක් රු.3,495,536 ක් වැයකර රසායනාගාරයකට අවශ්‍ය අංගෝපාංගයන් සහිතව අලුත්වැඩියා කර තිබුණු අතර 2015 දෙසැම්බර් මාසයේදී තත්ත්ව පාලන නිලධාරිනියකද බඳවාගෙන තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව සතුව

සහල් තොග නොපැවතීම හේතුවෙන් මෙම රසායනාගාරයෙන් අපේක්ෂා කළ අරමුණු ඉටු වී නොතිබුණි.

(ඈ) ඉන්දියානු හා පකිස්ථානු රජයෙන් මෙරටට ලැබී තිබුණු ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට අයත් සහල් මෙට්‍රික් ටොන් 5000 ක් කඩිනමින් ධූමායනය කර දෙන ලෙස ආහාර කොමසාරිස්ට දන්වා තිබුණි. අදාල සේවාව දෙපාර්තමේන්තුව මගින් සිදු කිරීමට අවශ්‍ය මූලික අවශ්‍යතා සපුරා තිබියදී, දෙපාර්තමේන්තුව බාහිර ආයතනවලින් මිල ගණන් කැඳවා ධූමායන කටයුතු සඳහා රසායන ද්‍රව්‍ය සැපයීමේ පදනම මත එම සේවය පෞද්ගලික ආයතනයකට පවරා දී තිබුණි. දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා වැය කර තිබුණු එකතුව රු.මිලියන 1.06 ක මුදල 2018 සැප්තැම්බර් 11 දින වන විටත් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් අයවී නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව රාජ්‍ය ආයතන 09 කට හා පුද්ගලික ආයතනයකට කුලියට ලබා දුන් ගබඩා 10 ක් සඳහා දෙපාර්තමේන්තුව විසින් ගෙවන ලද රු.මිලියන 4.30 ක් වූ වරිපනම් ගාස්තු අදාල ආයතනවලින් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුව පරිහරණය කරනු ලබන රත්මලාන ගබඩා සංකීර්ණයේ ගබඩාවක් සඳහා ගෙවිය යුතු රු.මිලියන 1.67 ක් වූ වරිපනම් ගාස්තුව හා ඒ තුල ඇතුලත් දඩ මුදල 2018 සැප්තැම්බර් 11 දින වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2017 දෙසැම්බර් 31 දින වන විට අධිකරණ කටයුතු සඳහා යොමු කර ඇති නඩු සංඛ්‍යාව 47 ක් වූ අතර ඉන් නඩු 32 ක්ම ධාන්‍යාගම නිවාස සංකීර්ණයේ නිවාස සන්තකය ආපසු ලබා ගැනීම සඳහා යොමු කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී මෙම නඩු වලින් 5 ක් පමණක් අවසන් වී තිබුණු අතර අනෙකුත් නඩු කිසිවක් නිරවුල් වී නොතිබුණි.

(උ) කොළඹ දිස්ත්‍රික්කයේ,කොළඹ මහනගර සීමාව තුල පිහිටි වරිපනම් අංක 330 හා 330 A හි පිහිටි ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇති ඉඩමේ අයිතිය 2018 ජුනි 30 දින වන විටත් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඉඩම් ආඥා පනත යටතේ ලබා දෙන ලද ඉඩම් පැවරීමේ සහතිකයද ලැබී නොතිබුණි.

(ඌ) වේයන්ගොඩ විද්‍යාත්මක ගබඩාවේ ගබඩා කිරීම සඳහා 2012 සහ 2013 වර්ෂයවලදී සහල් ලබා දීමේ පදනම මත මෝල් හිමියන් වෙත ලබා දුන් වී වෙනුවෙන් ලැබිය යුතු සහල් ප්‍රමාණය මෝල් හිමියන් විසින් ලබා දී නොතිබීම හේතුවෙන් අයවිය යුතු රු.මිලියන 7.39 ක් වාර්තාවේ දින වන විටත් අයවී නොතිබුණි.

**2.5 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනයඋපයෝජනය කිරිම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 225.46 | 188.07 | 37.39 | 16.58 |
| | මූලධන | 27.82 | 18.86 | 8.95 | 32.17 |
| | **එකතුව** | **253.28** | **206.93** | **46.35** | **18.29** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2014 | පුනරාවර්තන | 151.84 | 150.76 | 1.08 | 0.71 |
| | මූලධන | 22.87 | 16.96 | 5.91 | 25.84 |
| | **එකතුව** | **174.71** | **167.72** | **6.99** | **4.00** |
| 2015 | පුනරාවර්තන | 206.69 | 192.64 | 14.05 | 6,79 |
| | මූලධන | 21.68 | 2.07 | 19,.68 | 90.72 |
| | **එකතුව** | **228.37** | **194.65** | **33.72** | **14.77** |
| 2016 | පුනරාවර්තන | 298.87 | 294.28 | 4.60 | 1.54 |
| | මූලධන | 59.43 | 49.58 | 9.85 | 16.54 |
| | **එකතුව** | **358.30** | **343.86** | **14.45** | **4.03** |
| 2017 | පුනරාවර්තන | 530.84 | **529.43** | 1.40 | 0.26 |
| | මූලධන | 204.03 | 180.13 | 23.90 | 11.71 |
| | **එකතුව** | **734.87** | **709.56** | **25.31** | **3.44** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

ඇස්තමේන්තු විධිමත්ව හා නිසිපරිදි සකස් නොකර ගොඩනැගිලි ඉදිකිරීම් වැය විෂයය යටතේ වේයන්ගොඩ පිහිටි ගබඩාවේ විදුලි පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන 38.00 ක පරිපූරක ප්‍රතිපාදන අනුමත කරගෙන තිබුණද, ලංකා විදුලි බල මණ්ඩලයේ ඇස්තමේන්තු අනුව මේ සඳහා වැය වී තිබුණේ රු.මිලියන 11.97 ක් පමණි.

## 2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 30001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 7.00 | 7.00 | 3.60 | 6.52 | 42.00 | 19.13 |

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

-----------------------------------------

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 2,330,611 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 20 ක සිට වර්ෂ 25 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වි තිබුණි.

**2.7 ගනුදෙනු බේරා වසාදැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම**

---------------------------------------------------------------------------

අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව අත්තිකාරම් ගිණුම් කාර්යයන් 01 ක ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා ආහාර දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ඇවර කිරීමේ කටයුතු අවසන් නොකිරීම**

-----------------------------------------

(i). 2003 දෙසැම්බර් 10 දිනැති අංක අමප/03/1176/126/017/ඊපීසී/445 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අතිරේක අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක බීඩී/ඒඩීජීසී/සීඕඑම්/එෆ්සී/එෆ්ඩී හා 2004 අගෝස්තු 23 දිනැති ලිපිය මඟින් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ ආහාර මිලදී ගැනීමේ හා බෙදා හැරීමේ අත්තිකාරම් ගිණුම 2004 දෙසැම්බර් 31 දිනට වසා දැමීමට හා ඇවර කිරීමේ කටයුතු සඳහා දෙපාර්තමේන්තුව හෝ අමාත්‍යාංශය යටතේ ඇවර කිරීමේ ඒකකයක් පවත්වාගෙන යන ලෙස උපදෙස් දී තිබුණි. එසේ වුවද, එවැනි ඒකකයක් පත්කළ බවට සාක්ෂි නොවූ අතර එම ඇවර කටයුතු ආහාර කොමසාරිස්වරිය විසින් සිදුකර තිබුණු අතර, වසර 13 ක් ගතවී තිබියදීත් ඇවර කිරීමේ කටයුතු නිමකර නොතිබුණි.

(ii). එමෙන්ම අයකරගත නොහැකි ණයගැතියන් හා කාරක පාඩු කපාහැරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද, තොග හිඟ අධිහාර හා සමුපකාර ණයගැති ශේෂ නිරවුල් කිරීම සඳහා ප්‍රතිපාදන ලැබීම් අදියරෙන් අදියර සිදුකිරීම හා ආහාර දෙපාර්තමේන්තුව විසින් ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුමට අයත් ස්ථාවර වත්කම් රජයේ වී හා සහල් ගබඩා කිරීම සඳහා භාවිතා කිරීම වැනි හේතු නිසා ඇවර කිරීමේ ගිණුම පියවා අවසන් කළ හැකි නිශ්චිත දිනයක් ප්‍රකාශයට පත් කළ නොහැකි බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(iii). සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට කපාහැරීමට ඇති පාඩුවල වටිනාකම රු.මිලියන 4,046.69 ක් වූ අතර, එහි ඇතුලත් ආහාර මිලදී ගැනීමේ හා බෙදා හැරීමේ ඇවර ගිණුමේ සමුච්චිත අලාභය සහ ගබඩා භාරකරුවන්ගෙන් අයකර ගත නොහැකි අධිහාර ශේෂ ලෙස රු.මිලියන 456.82 ක් සමාලෝචිත වර්ෂයේදී වැය විෂයය 1701 යටතේ ප්‍රතිපාදන ලබාගෙන කපා හැර තිබුණි.

(iv). තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති රු.මිලියන 3,590.17 ක් වූ පාඩු වල මුළු එකතුව සැදී ඇති ආකාරය දැක්වෙන විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

**(ආ) අනුමැතිය රහිත ගනුදෙනු**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2002 හා 2003 වර්ෂවලදී රු.මිලියන 1.07 ක් වටිනා මෝටර් රථ 02 ක් කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයට හා සමූපකාර අමාත්‍යාංශයට භාරදී තිබුණි. මෙම වාහන 02 භාරදී වර්ෂ 14 ක් ගතවී ඇතත්, අය කර ගැනීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී මෙම වටිනාකම විධිමත් අනුමැතියක් රහිතව සමුච්චිත ලාභලාභ ගිණුමට හර කර තිබුණි.

(ii) 2016 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සංස්ථා වලින් අයවීමට තිබූ රු.මිලියන 88.50 ක් වූ සමාජ සේවා අධ්‍යක්ෂ නියං සහනාධාර ණයගැති වටිනාකම විධිමත් අනුමැතියක් රහිතව සමුච්චිත ලාභලාභ ගිණුමට හර කර තිබුණි.

(iii) අත්තිකාරම් ගිණුම සතු වත්කම් උපලබ්ධි වන අවස්ථාවේදී අදාල ගිණුම්කරණ ගැලපීම සිදු කරන බව ගිණුමෙහි දක්වා තිබුණද එයට පටහැනිව විධිමත් අනුමැතියක් රහිතව ඉවත් කිරීමේ ගිණුම්වලට බැර කර තිබූ රු.මිලියන 27.66 ක් වූ ස්ථාවර වත්කම් උපලබ්ධි වටිනාකම සමුච්චිත ලාභලාභ ගිණුමට බැර කර තිබුණි.

**(ඇ) අයකර ගත යුතු වූ ණයගැති ශේෂ**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දිස්ත්‍රික්ක 22 කට අයත් විවිධ සේවා සමූපකාර සමිති 175 කට සහල්, පිටි, සීනි, ආහාර මුද්දර හා භූමි තෙල් මුද්දර ණය පදනම මත නිකුත් කිරීම හේතුවෙන් සමූපකාර සමිති වෙතින් 2016 දෙසැම්බර් 31 දිනට රු.170,945,536 අයකර ගත යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ණය මුදලින් රු.422,001 ක් පමණක් අයකරගෙන තිබුණි. ඒ අනුව ණයගැති ශේෂ අයකර ගැනීම දුර්වල මට්ටමක පැවතිණි.

(ii) 2016 දෙසැම්බර් 31 දිනට පැවති රු.47,265,198 ක්වූ තොග හිඟ ණයගැතියන්ගෙන් රු.34,474 ක් පමණක් වර්ෂය තුළ අය කරගෙන තිබුණු අතර මෙම ශේෂවලින් රු.957,334 ක් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත කපා හැර තිබුණි. තවද, අනෙකුත් ණය මුදල් අයකර ගැනීමට අවශ්‍ය ඵලදායි පියවර ගෙන නොතිබුණි.

(iii) වර්ෂ ගණනාවක සිට රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා සංස්ථා වලින් රු.172,206,845 ක් අයකර ගැනීමට තිබූ අතර ඉන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණු අතර මෙම ණය නිරවුල් කිරීමට අවශ්‍ය ඵලදායී පියවර ගෙන නොතිබුණි.

## 2.8 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 149.721 ක් පැවති අතර ඉන් අංක 6000/0000/0013/0131/000 දරන තැන්පත් ගිණුමේ පැවති රු.54,774,646 ක ශේෂයෙන් 1989 වර්ෂයේ සිට පැවත එන තැන්පතුද ඇතුලත්ව තිබුණි. මුදල් රෙගුලාසි 571(3) අනුව අතර රජයේ ආදායමට ගත හැකි තැන්පතු පිළිබඳව සොයා බලා නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් කර නොතිබුණි.

## 2.9 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් එම කටයුතු සිදු කරනු ලබයි. මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව දෙපාර්තමේන්තුව සම්බන්ධව ඉදිරිපත් කළ යුතු අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.10 මානව සම්පත් කළමනාකරණය

### අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 51.62 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 03 | 02 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 116 | 45 | 71 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 103 | 53 | 50 | - |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | - | 01 | - | 01 |
| | එකතුව | 227 | 103 | 125 | 01 |

දෙපාර්තමේන්තුවේ ගබඩාවල සහල් තොග නොපැවතීමත්, බාහිර ආයතනවල ධූමායන සේවාවන් මෙම දෙපාර්තමේන්තුවට නොලැබීමත් හේතුවෙන් දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන නිලධාරිනිය, නිෂ්කාර්ය වී තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුතු ධූමායන කරුවන් 11 දෙනා දෙපාර්තමේන්තුවේ විවිධ ශාඛාවල කාර්යය සහායකයන්ට අයත් වැඩ පැවරීම් සිදු කර තිබුණි.